පානදුර ප්‍රාදේශීය සභාව - 2020

-----------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

---------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

පානදුර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) ( ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.<br>(අ) වර්ෂය තුල දේපළ හා පිරියත මිලදී ගැනීම් වටිනාකම රු.20,250,348 ක් වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.14,328,848 ක් ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරිත්වයෙන් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.5,921,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br>(ආ) වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ රු.65,632,283 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල රු.53,130,866 ක් ලෙස දැක්වීම නිසා වර්ෂය ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ රු.12,501,417 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br>(ඇ)මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරිමේදී ස්ථාවර තැන්පත් පොලී ආදායම වර්ෂයේ මෙහෙයුම් ආදායමින් අඩුකර එම අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.<br>(ඈ)වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ අඩුවීම රු.12,501,417 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශය එය රු.9,749,094 ක් ලෙස රු.2,752,323 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රථම වරට ගිණුම් සකස් කිරීම නිසා සිදු වූ අඩුපාඩුවක් බවත් ඉදිරියේදී නිවැරදිව සකස් කරන බව | නිවැරදිව ගිණුම්වලට ගැලපිය යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබාදී තිබු රු.11,934,000 ක් වු කම්පැක්ටර් රථයේ වටිනාකම රු.279,000 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කිරීම නිසා ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | සිදු වු වරද නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරිම් හා වැඩි දියුණු කිරීම් අයිතම 04 ක පිරිවැය වු රු.2,625,005 ක් ඉඩම් හා ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඇ) ජර්නල් සටහන් අංක 24 මගින් කර්මාන්ත ණයහිමි අවසාන ශේෂයේ වටිනාකම රු.18,749,336 ක් වියදම් පාලන ගිණුමේ හරට ගිණුම්ගත කිරිම නිසා එම වටිනාකමින් වියදම් පාලන ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (ඇ) ජර්නල් සටහන් අංක 33 මගින් ඉකුත් වර්ෂයේ පොදු ගබඩා ඌණ ගැලපීම් රු.5,487,834 ක් ලෙජරයට සටහන් කිරිමේදී පොදු ගබඩා ගිණුම බැරට හා ඌණතා අතිරික්ත ගිණුම හරට වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිදු වු වරද නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) ජර්නල් සටහන් අංක 34 මගින් ඉකුත් වර්ෂයේ විදුලි ගබඩා තොගය රු.398,000 ක් වැඩියෙන් සටහන්වීම නිවැරදි කිරීමේදී විදුලි ගබඩා ගිණුම බැර කලද, ඌණතා අතිරික්ත ගිණුම රු.398,000 ක් හර කර නොතිබුණි. | | |
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් තිදෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් ලැබිය යුතු රු.108,588 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | එක් සේවකයෙකුගෙන් මේ වන විට රු.4,661 ක මුදල අයකර ඇති අතර සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.103,929 විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව | |
| (උ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.32,615,460 ක් වුවද, වර්ෂය තුල ලබාදුන් ණය මුදල වු රු.10,385,442 ක් පමණක් මුල්‍ය ප්‍රකාශයේ දක්වා තිබුණි. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ආයුර්වේද බෙහෙත් ශාලා 02 හි අවසාන ඉතිරි තොග වටිනාකම රු.46,200 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.75,000,000 ක් හා උසාවි දඩ මුදල් රු.2,000,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2021 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) ශේෂ පිරික්සුමට අනුව රු.81,965,809 ක් වූ කර්මාන්ත ණයගැතියන් හා රු.18,749,336 ක් වූ කර්මාන්ත ණයහිමියෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙවැනි වැරදි ඉදිරියේදි සිදු නොවීමට ක්‍රියා කරන බව | නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඔ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.450,459 අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සිදු වූ වරද නිවැරදි කරන බව | |
| (ඕ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර තැන්පතු වටිනාකම රු.1,761,576 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සිදු වූ වරද නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ක) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබූ සේවක ණය පොලී රු.700,388 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙවැනි වැරදි ඉදිරියේදි සිදු වූ නොවීමට ක්‍රියා කරන බව | |
| (ග) සේවා ගිවිසුම් සඳහා ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.105,732 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිදු වූ වරද නිවැරදි කරන බව | |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 24 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.261,113,475 ක වෙනසක් විය. | 2021අවසාන ගිණුමෙන් නිවැරදි කරන බව | වෙනස හඳුනාගෙන ගිණුම නිවැරදි කිරිමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.29,679,395 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.51,036,602 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟ ආදායම් වාර්තාව අනුව අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.32,229,568 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල හිඟ වරිපනම් බදු ශේෂය ලෙස රු.40,186,581 ක් දක්වා තිබුණි. | සත්‍ය ශේෂය රු.40,186,561 ක් වූ අතර උපකාර්යාල වලින් ඉදිරිපත් කරන ලද තොරතුරු වැරදි නිසා එලෙස සිදු වී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි ශේෂ උපයෝගි කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රිඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණෙන් වැඩිහිටි නිවාසයකට අයත් අක්කර 16 ක වපසරියකින් යුතු කුඹුරු ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා රු.2,518,750 ක මුදලක් 2020 ජුනි 26 දින පානදුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණි. මෙම ඉඩම ඔප්පු අංක 14562 යටතේ 2004 ජුලි 23 දින පුද්ගලයෙකු විසින් ඔවුන්ගේ | මේ සඳහා සභාවේ වැඩ අධිකාරිගේ නිර්දේශය ලබාගෙන ඇති අතර මිලදී ගැනීමට අවශ්‍ය කරන නිර්දේශයන් අදාල ආයතන වලින් ලබාගෙන ඉඩම් අමාත්‍යංශයේ අනුමැතිය සඳහාද යොමු කර ඇත. ඉදිරියේදී මිලදී ගැනීම | ශක්‍යතා අධ්‍යනයක් සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමෙන් පසු මිලදී ගැනීමේ වැඩ ආරම්භ කළ යුතුය. |

| | | |
|---|---|---|
| ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වැඩිහිටි නිවාසය වෙත පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි. අපේක්ෂිත අරමුණු වලින් බැහැරව පිට්ටනියක් සකස් කිරීම වෙනුවෙන් ප්‍රාදේශිය සභාව විසින් ඉඩම අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පැවතුණි.තවද, මෙම කුඹුරු ඉඩම සඳහා මුදල් තැන්පත් කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබු අතර ඊට අදාල පිරිවැය ඇස්තමේන්තු ද සකස් කර නොතිබුණි. | සිදු කිරීමේදී ශක්‍යතා අධ්‍යනයක් සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කරන බව | |

**3.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාද්දුව මහජන පුස්තකාලයට අදාලව සිදුකර තිබු පොත් සමික්ෂණයේදි අපහරණය කල යුතු යැයි හඳුනාගත් වසර 2007 සිට 2017 දක්වා වටිනාකම රු.27,301 ක් වු පොත් 236 ක් , 2018 වර්ෂයේ වටිනාකම රු.12,112 ක් වු පොත් 110 ක් හා 2019 වර්ෂයේ වටිනාකම රු.18,405 ක් වු පොත් 191 ක් ලෙස එකතු වටිනාකම රු.57,818 ක් වු පොත් 537 ක් අපහරණය කිරිමට 2020 සැප්තැම්බර් 11 දිනය වන විටත් කටයුතු කර නොතිබුණි. | සභාව විසින් මීට අදාල කමිටුවක් පත්කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව | අපහරණය කලයුතු පොත් අපහරණය කිරිමට කටයුතු කළ යුතුය. |